ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2016 සැප්තැම්බර් මස 05 වැනි දින** |

## 2016 ජුනි මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

වෙළඳ හිඟය පුළුල් වීමත්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හා සංචාරක ඉපැයීම්වල වර්ධනය සාපේක්ෂව අඩු වීමත් සමඟ 2016 ජුනි මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. වසරේ පළමු මාස හතර තුළ දී ක්‍රමික අඩුවීමක් පෙන්නුම් කළ වෙළඳ හිඟය මැයි සහ ජුනි මාස තුළ දී අපනයන මෙන්ම ආනයනයන්හි ද සිදු වූ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් ඉහළ ගියේය. වසරේ පෙර මාස සමඟ සැසඳීමේදී ජුනි මාසය තුළ දී සංචාරක ඉපැයීම් අඩු වර්ධනයක් වාර්තා කළ අතර විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල වර්ධනය ද මධ්‍යස්ථ විය. කෙසේ නමුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ පළමු වාරිකය ලැබීම සහ ඒකාබද්ධ ණය පහසුකම මගින් වූ ලැබීම් හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ඉහළ ගියේය. මූල්‍ය ගිණුම වෙත වූ මෙම ලැබීම් සහ එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දැමීම තවදුරටත් කල් දැමීමත් සමඟ ගෝලීය ආර්ථිකයේ සිදු වූ වෙනස්කම්හි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන යථා තත්ත්වයට පත් විය. මේ හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන, වසරේ පළමු කාර්තුව තුළ දී වාර්තා කළ අඛණ්ඩ ගෙවීමට සාපේක්ෂව 2016 ජුනි මාසයේ දී ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මෙම වර්ධනයන් තුළින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමට සමගාමීව ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යැමත් සමඟ කෙටි හා මැදි කාලීනව

ගෙවුම් තුලන තත්ත්වය ශක්තිමත් කරනු ඇතැයි ද, ඒ අනුව ශ්‍රී ලංකාවේ සංචිත තත්ත්වය වර්ධනය වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

**අපනයන ක්‍රියාකාරිත්වය**

පෙර වසර සමඟ සැසඳීමේ දී 2016 ජුනි මාසයේ දී අපනයන ආදායම අඛණ්ඩව 16 වන මාසයටත් අඩු වූ අතර මේ සඳහා ජාත්‍යන්තර වෙළඳපොළෙහි අපනයන භාණ්ඩවල මිල මට්ටම සැලකිය යුතු ලෙස අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2015 ජුනි මාසයේ එ.ජ.ඩොලර් මිලියන 944 ක් වූ අපනයන ආදායම 2016 ජුනි මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 897 ක් දක්වා සියයට 5.0 කින් අඩු වූ අතර, ඒ සඳහා මූලික ලෙස ඛණිජතෙල් නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ හා කුළුබඩු අපනයනයේ වාර්තා වූ දුර්වල ක්‍රියාකාරිත්වය හේතු විය. ප්‍රධාන වශයෙන් නැව් හා ගුවන් යානා ඉන්ධනවලින් සමන්විත වන ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම 2016 ජුනි මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 53.2 කින් සැලකිය යුතු ලෙස අඩු වූ අතර, නැව් සඳහා වන ඉන්ධන අපනයන පරිමාව අඩු වීම සහ අපනයන සාමාන්‍ය මිල අඩු වීම යන දෙකෙහිම බලපෑම මේ සඳහා හේතු විය. තවද, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ප්‍රවාහන උපකරණ අපනයන ආදායම සියයට 74.7 කින් සැලකිය යුතු ලෙස අඩු වූ අතර, ඒ සඳහා 2015 ජුනි මාසයේ දී මගී ප්‍රවාහන නෞකා දෙකක් අපනයනය කිරීම හේතුවෙන් එම මාසයේ දී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම ඉහළ අගයක පැවතීම හේතු විය. 2016 ජුනි මාසයේ දී කුළුබඩු අපනයන ආදායම 2016 වසරේ මෙතෙක් පැවති ඉහළම අගය වාර්තා කළ ද, විශේෂයෙන් කුරුඳු වැනි අනෙකුත් කුළුබඩු අපනයන ඉහළ අගයක පැවතිය ද ගම්මිරිස් සහ කරාබු නැටි අපනයනයේ දුර්වල වූ ක්‍රියාකාරිත්වය හේතුවෙන්, එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 20.0 කින් අඩු විය. මෙයට අමතරව, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම අඩු වීම ද සමස්ත අපනයන ආදායම අඩු වීමට සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, සියලුම උප කාණ්ඩයන්ගේ ඉහළ ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කරමින් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම 2016 ජුනි මාසයේ දී සැලකිය යුතු ලෙස සියයට 96.9 කින් වැඩි විය. තවද, මුළු අපනයන ආදායමෙන් සියයට 48 ක් පමණ වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම 2016 ජුනි මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 430 ක් දක්වා සියයට 1.4 කින් වැඩි වූ අතර ඒ සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයට මෙන්ම කැනඩාව, චීනය හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදු කරන ලද ඉහළ ඇඟලුම් අපනයනය හේතු විය. මෙයට අමතරව, මූල ලෝහ හා මූල ලෝහ

නිෂ්පාදිත සහ ආහාර, පාන හා දුම්කොළ අපනයන ආදායම මෙම මාසයේ දී සමස්ත අපනයන ආදායමේ වැඩිවීම සඳහා දායක විය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2016 වසරේ පළමු භාගයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 5,108 ක් දක්වා සියයට 5.8 කින් අඩු වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රවාහන උපකරණ, ඛනිජතෙල් නිෂ්පාදිත, තේ සහ කුළුබඩු අපනයන ආදායමේ අඩු වීම හේතු විය. 2016 වසරේ පළමු භාගයේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ප්‍රධාන වෙළඳපොළ වූ අතර, එම රටවලට කළ අපනයන මුළු අපනයනයෙන් සියයට 53 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම**

| කාණ්ඩය | 2015 ජුනි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජුනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-ජුනි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-ජුනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **713.8** | **679.2** | **(4.9)** | **4,154.4** | **3,981.9** | **(4.2)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 424.3 | 430.2 | 1.4 | 2,405.4 | 2,514.7 | 4.5 |
| රබර් නිෂ්පාදිත | 65.5 | 63.3 | (3.4) | 398.0 | 372.0 | (6.5) |
| ආහාර, පාන වර්ග සහ දුම්කොළ | 22.8 | 25.0 | 9.5 | 133.3 | 151.4 | 13.6 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 25.3 | 21.9 | (13.6) | 181.7 | 148.4 | (18.4) |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 48.3 | 23.0 | (52.3) | 224.1 | 132.2 | (41.0) |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 9.8 | 19.4 | 96.9 | 71.7 | 81.6 | 13.7 |
| ප්‍රවාහන උපකරණ | 30.0 | 7.6 | (74.7) | 208.0 | 67.1 | (67.7) |
| මූල ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.0 | 7.6 | 53.1 | 30.8 | 36.8 | 19.7 |
| වෙනත් | 82.7 | 81.3 | (1.7) | 501.4 | 477.7 | (4.7) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **226.7** | **214.1** | **(5.6)** | **1,244.7** | **1,104.7** | **(11.3)** |
| තේ | 121.9 | 121.9 | (0.1) | 682.9 | 618.4 | (9.5) |
| කුළුබඩු | 39.9 | 32.0 | (20.0) | 170.8 | 125.3 | (26.6) |
| මුහුදු ආහාර | 13.5 | 12.9 | (3.9) | 85.8 | 83.5 | (2.7) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 12.7 | 10.0 | (21.3) | 84.2 | 56.9 | (32.5) |
| සකස් නොකළ දුම්කොළ | 2.3 | 1.9 | (16.1) | 16.5 | 16.3 | (1.3) |
| එළවළු | 2.2 | 2.1 | (3.0) | 16.1 | 13.2 | (18.0) |
| වෙනත් | 34.2 | 33.3 | (2.6) | 188.4 | 191.1 | 1.5 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **3.6** | **3.5** | **(1.6)** | **25.3** | **21.2** | **(16.3)** |
| **මුළු අපනයන** | **944.1** | **896.8** | **(5.0)** | **5,424.4** | **5,107.7** | **(5.8)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

**ආනයන ක්‍රියාකාරිත්වය**

2016 ජූනි මාසයේ දී ආනයන වියදම, 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,676 ක් දක්වා සියයට 0.2 කින් සුළු වශයෙන් අඩු විය. කෙසේ වුවද, මෙය වසරේ මේ දක්වා කාලය තුළ වාර්තා වූ ඉහළම මාසික ආනයන අගය වේ. රථවාහන, තිරිඟු සහ පොහොර ආනයන වියදම මෙම මාසය තුළ දී කැපී පෙනෙන ලෙස පහත වැටුණි. රථවාහන ආනයනය අඩු කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති පෞද්ගලික මෝටර් රථ ආනයනය 2016 ජූනි මාසයේ දී සියයට 52.0 කින් විශාල ලෙස අඩු වූ අතර, ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති ප්‍රවාහන උපකරණ ආනයන ද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 38.0 කින් අඩු විය. මෝටර් රථ, ත්‍රිරෝද රථ සහ කුලී රථ ආනයන මෙම මාසය තුළ දී කැපී පෙනෙන ලෙස අඩු විය. මේ අතර, තිරිඟු ආනයන පරිමාවන් සහ මිල ගණන්වල සිදු වූ විශාල අඩු වීම පිළිබිඹු කරමින් 2016 ජූනි මාසයේ දී තිරිඟු සහ ඉරිඟු ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 88.9 කින් කැපී පෙනෙන ලෙස අඩු විය. සියලුම උප කාණ්ඩවල අඩුවීම් පිළිබිඹු කරමින් පොහොර ආනයන වියදම ද සියයට 77.1 කින් අඩු විය. තවද, සකස් නොකළ දුම්කොළ, මුද්‍රිත ද්‍රව්‍ය හා ලිපිද්‍රව්‍ය සහ රෙදිපිළි සහ උපාංග, සමස්ත ආනයන වියදම අඩු වීම කෙරෙහි විශාල ලෙස දායක විය. කෙසේ වුවද, මුළු ආනයනයෙන් සියයට 22 ක් පමණ වූ යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම 2016 ජූනි මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පිළිවෙළින් සියයට 16.6 කින් සහ සියයට 27.0 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, සියලුම උප කාණ්ඩවල පැවති ඉහළ ආනයන වියදම මේ සඳහා හේතු විය. 2016 ජූනි මාසයේ දී රත්‍රං ආනයන වියදම විශාල ලෙස වර්ධනය වූ අතර, මෙම මාසය තුළ දී විශාල රත්‍රං ප්‍රමාණයක් ආනයනය කිරීම මෙන්ම පෙර වසරේ අනුරූප මාසයේ දී රත්‍රං ආනයනය නොකිරීම මේ සඳහා හේතු විය. තවද, 2016 ජූනි මාසයේ දී මූල ලෝහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 64.5 කින් වර්ධනය වූ අතර ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ ආනයන ඉහළ යෑම මීට හේතු විය. එසේම, ඉන්ධන මිල ගණන් අඩු වුවද, සියලුම ඉන්ධන උප කාණ්ඩවල පරිමාවන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 5.9 කින් වර්ධනය විය.

සමුච්චිත වශයෙන් සැලකූවිට, 2016 පළමු මාස හය තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 9,321 ක් දක්වා සියයට 2.4 කින් අඩු වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්


ඉන්ධන, ප්‍රවාහන උපකරණ, පෞද්ගලික රථවාහන සහ සහල් ආනයනවල වාර්තා වූ අඩු වීම හේතු විය. 2016 පළමු මාස හය තුළ දී ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස චීනය, ඉන්දියාව, සිංගප්පූරුව, ජපානය, සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය පැවති අතර එම රටවලට කළ ආනයන මුළු ආනයනයෙන් සියයට 56 ක් පමණ විය.


**සංඛ්‍යා සටහන 2: ආනයන වියදම**

| කාණ්ඩය | 2015 ජුනි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජුනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-ජුනි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-ජුනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **391.3** | **354.1** | **(9.5)** | **2,307.4** | **2,107.7** | **(8.7)** |
| ආහාර හා පාන වර්ග | 126.8 | 137.4 | 8.3 | 870.6 | 775.7 | (10.9) |
| සීනි හා රසකැවිලි | 17.9 | 25.0 | 39.5 | 141.1 | 133.7 | (5.3) |
| කිරි නිෂ්පාදිත | 25.7 | 22.4 | (13.1) | 122.4 | 119.4 | (2.4) |
| පාන වර්ග | 5.7 | 9.2 | 61.7 | 37.0 | 42.5 | 14.9 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.7 | 1.7 | (63.0) | 133.4 | 11.0 | (91.8) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 72.8 | 79.1 | 8.6 | 436.8 | 469.1 | 7.4 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 264.5 | 216.7 | (18.1) | 1,436.8 | 1,332.0 | (7.3) |
| වාහන | 118.5 | 56.9 | (52.0) | 596.5 | 419.3 | (29.7) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 40.4 | 53.0 | 31.3 | 228.5 | 264.3 | 15.6 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 105.6 | 106.8 | 1.2 | 611.8 | 648.4 | 6.0 |
| **2. අන්තර් භාණ්ඩ** | **909.7** | **909.7** | **0.0** | **4,951.9** | **4,780.4** | **(3.5)** |
| ඉන්ධන | 287.3 | 304.2 | 5.9 | 1,473.3 | 1,177.8 | (20.1) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 57.7 | 49.0 | (14.9) | 297.8 | 296.7 | (0.4) |
| දියමන්ති සහ අගනා ගල් හා ලෝහ වර්ග | 16.2 | 44.1 | 173.1 | 117.3 | 213.0 | 81.5 |
| මූල ලෝහ | 34.3 | 56.5 | 64.5 | 244.6 | 190.2 | (22.2) |
| තිරිඟු හා ඉරිඟු | 53.5 | 5.9 | (88.9) | 174.9 | 133.1 | (23.9) |
| පොහොර | 28.2 | 6.5 | (77.1) | 139.8 | 74.9 | (46.4) |
| වෙනත් | 432.5 | 443.5 | 2.5 | 2,504.4 | 2,694.9 | 7.6 |
| **3. ආයෝජන භාණ්ඩ** | **377.1** | **410.1** | **8.7** | **2,277.8** | **2,426.7** | **6.5** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 192.6 | 224.6 | 16.6 | 1,142.7 | 1,371.9 | 20.1 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 108.5 | 137.9 | 27.0 | 617.5 | 760.7 | 23.2 |
| ප්‍රවාහන උපකරණ | 75.6 | 46.8 | (38.0) | 515.1 | 290.9 | (43.5) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.7 | 105.6 | 2.5 | 3.3 | 31.0 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.6** | **1.9** | **210.2** | **9.6** | **6.2** | **(35.4)** |
| **මුළු ආනයන** | **1,678.7** | **1,675.8** | **(0.2)** | **9,546.7** | **9,321.0** | **(2.4)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




**වෙළඳ ශේෂය**

2016 ජුනි මාසයේ දී වෙළඳ ගිණුමෙහි හිඟය, පෙර වසරේ අනුරූප මාසයෙහි පැවති එ.ජ.ඩොලර් මිලියන 735 හි සිට එ.ජ.ඩොලර් මිලියන 779 ක් දක්වා පුළුල් වූ අතර ආනයන අඩුවීමට සාපේක්ෂව අපනයන විශාල ලෙස අඩු වීම මේ සඳහා හේතු විය. 2016 වසරේ පළමු අර්ධයේ දී සමුච්චිත වෙළඳ හිඟය ද, 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පැවති එ.ජ.ඩොලර් මිලියන 4,122 හි සිට එ.ජ.ඩොලර් මිලියන 4,213 ක් දක්වා වර්ධනය විය.

**සංචාරක ඉපැයීම්**

සංචාරකයින් වැඩි වශයෙන් පැමිණෙන කාලසීමාව අවසන් වීමත් සමඟ 2016 ජුනි මාසයේ දී සංචාරක ඉපැයීම් සියයට 2.2 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, 2016 වසරේ පළමු මාස හය තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම්[1] 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,375.7 සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 1,598.2 ක් දක්වා ඉහළ ගියේය. ජුනි මාසය තුළ දී සංචාරක පැමිණීම් ප්‍රමාණය 118,038 ක් විය. රුසියාවෙන් වූ සංචාරක පැමිණීම්හි කැපී පෙනෙන අඩුවීමක් සිදු වූ අතර, මැදපෙරදිග රටවලින් වූ සංචාරක පැමිණීම් මධ්‍යස්ථව පැවතුණි. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තෙල් මිල නොවෙනස්ව පැවතීම හේතුවෙන් මෙම කලාප දෙකෙහිම ආර්ථිකයන්ට බලපෑම් එල්ල වීම මේ සඳහා හේතු විය. 2016 වසරේ පළමු මාස හය තුළ දී සමුච්චිත සංචාරක පැමිණීම් සංඛ්‍යාව 2015 වසරේ අනුරූප

1 සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2016 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

කාලපරිච්ඡේදයට සාපේක්ෂව 964,267 දක්වා සියයට 16.2 කින් වැඩි වූ අතර ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය 2016 ජුනි දක්වා සංචාරකයින් පැමිණීමේ ප්‍රධාන මූලාශ්‍ර පහ විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2016 ජුනි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.4 ක වර්ධනයත් සමඟ මධ්‍යස්ථව පැවතුණි. මේ හේතුවෙන් 2016 වසරේ පළමු භාගයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණයන්හි සමුච්චිත වර්ධනය 2015 වසරේ පළමු භාගයට සාපේක්ෂව සියයට 5.3 ක් විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම සඳහා මැදපෙරදිග රටවල ආර්ථිකයන්හි මන්දගාමී ස්වරූපය සහ නුපුහුණු අංශය යටතේ වන ශ්‍රම සංක්‍රමණ අඩු වීම හේතුවක් විය හැකිය. මේ අනුව, 2016 වසරේ පළමු මාස හය තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 3,613.1 ක් විය.

**මූල්‍ය ලැබීම්**

2016 ජුනි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකමෙහි පළමු වාරිකය ලෙස එ.ජ.ඩොලර් මිලියන 168 ක් ලැබීමත් සමඟ මූල්‍ය ගිණුම ශක්තිමත් විය. මෙය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ ලද පළමු ණය වාරිකය වේ. මාසය තුළ දී ඒකාබද්ධ ණය වශයෙන් ලබාගත් එ.ජ.ඩො. මිලියන 300 මගින් ද මූල්‍ය ගිණුම ශක්තිමත් විය. ඒ අනුව, 2016 වසරේ පළමු මාස හය තුළ දී රජය වෙත වූ මුළු විදේශීය ණය 2015 වසරේ පළමු මාස හය තුළ දී වූ එ.ජ.ඩොලර් මිලියන 147.2 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 353.9 ක ශුද්ධ ලැබීමක් විය. 2016 ජුනි මාසයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 71.1 ක ශුද්ධ ලැබීමත් සමඟ රාජ්‍ය සුරැකුම්පත්වල වූ විදේශීය ආයෝජන ද නැවත ඉහළ ගියේය. වසරේ පළමු කාර්තුවේ දී ශුද්ධ ගෙවීමක් වාර්තා කළ රාජ්‍ය සුරැකුම්පත්වල වූ විදේශීය ආයෝජන දෙවන කාර්තුවේ දී ක්‍රමයෙන් වර්ධනය විය. 2016 වසරේ පළමු භාගයේ දී රාජ්‍ය සුරැකුම්පත්හි විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 371.8 ක සමුච්චිත ශුද්ධ ගෙවීමක් විය. තවද, 2016 වසරේ පළමු භාගයේ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 40.9 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, එය ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ.ඩොලර් මිලියන 42.2 ක ශුද්ධ ගෙවීමකින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 1.3 ක ලැබීමකින් සමන්විත විය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

සමස්ත ගෙවුම් තුලනය 2016 මැයි මාසය දක්වා වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 1,142 ක හිඟයට සාපේක්ෂව 2016 පළමු මාස හය තුළ එ.ජ.ඩොලර් මිලියන 1,186 ක හිඟයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතයේ හැසිරීම**

2016 ජුනි මස අග වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.4 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 5.3 ක් වූ අතර, මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 4.7 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 7.3 ක් විය.

2015 අවසානයේ සිට 2016 සැප්තැම්බර් 02 දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 1.0 ක සුළු අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාත හැසිරීම මත පදනම්ව මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝවලට එරෙහිව සියයට 3.4 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 15.0 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 6.5 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 4.3 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.5 කින් ද අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 10.5 කින් අධිප්‍රමාණය විය.

# සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2015 ජුනි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජුනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-ජුනි (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-ජුනි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 944.1 | 896.8 | -5.0 | 5,424.4 | 5,107.7 | -5.8 |
| ආනයන | 1,678.7 | 1,675.8 | -0.2 | 9,546.7 | 9,321.0 | -2.4 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය (-)) | -734.6 | -779.0 | 6.0 | -4,122.3 | -4,213.3 | 2.2 |
| සංචාරක ඉපැයීම් | 191.4(ආ) | 195.6 | 2.2 | 1,375.7(ආ) | 1,598.2 | 16.2 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 629.6 | 644.5 | 2.4 | 3,432.7 | 3,613.1(ආ) | 5.3 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -13.3 | -3.7 | -72.5 | 44.8 | -40.9 | -191.3 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 802.5 | 587.5 | -26.8 | 1,778.8 | 1,402.9 | -21.1 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 21.3 | 193.6 | 807.5 | 547.4 | 601.1 | 9.8 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 650.0 | - | - | 650.0 | - | - |
| දිගුකාලීන ණය | 125.1 | 392.8 | 214.0 | 531.1 | 789.9 | 48.7 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 346.4 | 164.5 | -52.5 |

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.